# අභිරහස් බීජය



දෙසඳි දෙව්හාරා පතිරණගේ

# අභිරහස් බීජය

දෙසඳි දෙව්භාරා පතිරණගේ

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති -** අපූරු තෑග්ග,  අත්තම්මා, හොඳ යාහළුවෝ, කාල තරණය

ම/ මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

9 G

2026 මැයි මස 10

First Edition: 2026

ISBN: 978-624-211413-2

**පිදුම**

මා හට අධ්‍යාපනය ලබා දීමට අපමණ කැපවීම් කරන

මගේ අම්මාට ...........

මගේ තාත්තාට ...........

මා සිප්සතර හදාරන මහනුවර මහාමායා  බාලිකා විද්‍යාලයේ

විදුහල්පති තුමියට ...........

ගුරු මෑණිවරුන්ට ...........

ගුරු පියවරුන් ...........

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකතවයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරනයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන් වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශශිකලා සේනාධිර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

## <u>සුභාශිංසන පණිවුඩ</u>

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංශන පණිඩ්ඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාගයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකයාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශන්සනීය බව පැහැදිළිය.

මෙම ග්‍රන්ථකරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු අතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ඨ සාර්ථකත්වයක් ලබනු ඇතැයී ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත,
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
2026. 05. 10

## සුභාශිංසන පණිවුඩ

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියනක් සංවිධානය කළ මහාමායා බාලකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ඨ වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාරව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්යය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීටත් එමඟින් අනාගතයේද බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහිකිරීමට කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිළමේ,
ශ්‍රී දළදා මාලගාව
2026. 05. 10

“අම්මේ මම හතේ පන්තියේ හිටිය කාලේ සත්තු ගැන ලියපු ප්‍රොජෙක්ට් එක තියෙන්නේ කොහේද?” මීනා ඇසුවාය. “ඒක මොකට ද දැන්” අම්මා ඇයගෙන් ඇසුවාය. “ඒකේ තියෙන පිංතූරු ටිකක් හොයාගෙන මගේ විද්‍යාව පොතේ අලවගන්න ඕන” මීනා කීවාය.” ඒක මන් හිතන්නේ ගබඩා කාමරයේ ඇති එහෙ හොයල බලන්නකෝ”

මීනා ගබඩා කමරයට ගොස් ඇය විසින් ලියන ලද ප්‍රොජෙක්ට් එක හොයන්න පටන් ගත්තා එය සොයන ගමන් මීනා දැක්කා පරණ දූවිලි තැවරී ඇති පෙට්ටියක් ඒ පෙට්ටියේ උඩ “Open when you are ready” කියල ලියලා තිබුණා. මීනාට මේක දැකල හිනා ගියා. “ලැස්ති වෙන්නෙ මොකට ද? එකත් එකට ම අපේ අම්මා පොඩි කාලේ දි කරපු වැඩක් ද කොහෙ ද “ කියමින් ඇය සිනාසුනාය. ඇය ඒ පෙට්ටියේ පියන ඇර බැලුවාය. පෙට්ටිය ඇතුලේ තිබුණේ කුඩා ප්‍රමාණයේ බෝංචි ඇටයක් “මෙච්චරයි ද?” කියමින් මීනා තවත් පෙට්ටිය අවුස්සලා බැලුවාය. වෙන මොකුත් පෙට්ටියේ නොතිබුණ නිසා මීනාට සිනහ ගියාය. කාගේ හරි පිස්සු වැඩක් යයි සිතමින් ම බෝංචි ඇටය රැගෙන ගොස් සිටෙව්වාය. “දුව, අයියෝ ! තාම ඔය පොත හොයනව ද?” මීනාගේ මව කෑගැසුවාය.” නෑ නෑ අම්මේ මම ඒක හොයාගත්තා මේ එනවා” යැයි

කියමි ඇය ගේතුලට ගියාය. මීනා රාත්‍රී කෑම කා නින්දට යෑමට සූදානම් වූවාය.

මීනා උදෙන් ම අවදි වීය. නමුත්.... තමන් සිටි සුපුරුදු තැන නොවන බව ඇයට වැටහුණාය. ඇය ඇඳ සිටි ඇඳුමත් වෙනස්ය. SPACE ROOM කියලා ලියලා තියෙන දෙයක් ඇය දැක්කාය. “මම පාවෙනවා මේ මොකද මට වෙලා තියෙන්නේ ? මේ කොහෙද ඉන්නේ?” කියමින් ඈ කෑ ගැසුවාය. එතන සිටි අමුතුම ඇඳුමකින් සැරසී සිටි කෙනෙක් මීනා දෙස අමුතු ආකාරයකට බලා සිටින බව ඇය දැක්කාය. "අහ්හ්... හ්ම්ම් ... ඇයි?” ඇය ඔවුන්ගෙන් ඇසුවාය. “මීනාට හිටපු ගමන් පිස්සු හැදෙනවා ගණන් ගන්න එපා” යයි කියමින් ඉදිරියට ආවේ ලීසාය. ලීසා මීනාගේ හොඳම මිතුරිය ය. පිරිස විසිරී ගොස් ඔවුනොවුන්ගේ සාකච්ඡාවල නිරත වූහ. “මීනා පිස්සු නටන්න එපා” ලීසා කීවාය ය. “මට නෙවෙයිනෙ පිස්සු ඔයාටනේ පිස්සු මොකක් ද ඔයා ඔය ඇඳගෙන ඉන්නේ, ඒක නෙවෙයි ඔයා වෙනදාට වඩා වෙනස්, ගොඩාක් වෙනස් ඔයා ..... නිකම්..... ලොකු වෙලා වගේ නේ” මීනා කීවේ කලබලයෙනි. “අනේ මීනා ඔය හොඳටම ඇති” ලීසා කීවා ය. “මොනා ද ඇති කියන්නේ? ආ... උපන්දින සර්ප්‍රයිස් එකක් ද මේ . ඒ උනාට අද මගේ උපන්දිනය නොවෙයිනේ” “ අනේ මට නිකම් කැරකිල්ල වගේ. මේ .... ඇයි අපි පාවෙන්නේ, කරන්නේ මොකත් වුනත් දැන්ම මේක නවත්වන්න” මීනා කීවාය.” නවත්වන්න ඕන නම් ගෙදර ඉන්න තිබුණනේ, මොකට ද

ආවේ?" ලීසා කීවේ තරහෙනි. "කොහේ ද?" මීනා ඇසුවාය. "ඔයාට මෙතන ගහල තියන බෝර්ඩ් එක පේනව ද?" ලීසා තවමත් තරහින්ය. Ec .... Eclipse Runner - 12 Space craft Space craft එකක්? "මේ ... මම කොහෙද ඉන්නේ" මීනා ඇසුවේ ගොතගසමිනි. "අනේ ඇත්තමයි ...ඔයා මාව මේ විහිළුවට ගන්නව ද?" මීනා, ලීසාගෙන් ඇසුවාය. "මම මොකට ද විහිළු කරන්නේ මම ඇත්තටම දන්නේ නෑ මට මොකක් ද වුණේ කියල.... මම ඊයේ රෑ නිදාගන්න ඇඳට ගියා එච්චරයි මට මතක, අනේ මට බයයි" මීනා කීවාය. "හරි හරි මම හිතන්නේ මේ Space එක හින්දා වෙන්න ඇති ඔයාගේ මොළේ අවුලක් වෙලා තියෙන්නේ. මම කියන්නම්කෝ ... අපි දැන් මේ ඉන්නේ Eclipse Runner – 12 Space craft එකේ, අපි තව ටික වේලාවකින් Planet Mars වල Land කරනවා, ඔයාගේ ඔය පිස්සුව පැත්තකින් තියල, ඔයා දැන් ඒකට ලෑස්ති වෙන්න ප්ලීස්", ලීසා කියාගෙන ගියා ය. "අහ්... එ... එහෙම වෙන්නේ කොහොමද?" මීනා කීවාය. "අහ්හ්හ්... Just one more, Okay?" ලීසා කීවාය. "ඔ...ඔයාට වයස කීය ද?" මීනා ඇසුවාය. "අම්, ඒක ද? මම හිතුවේ ඔයා මීටත් වඩා බොළඳ ප්‍රශ්නයක් අහයි කියලා මට වයස අවුරුදු 20 යි දැන් නම් හොඳටම ඇති " මම යනවා ඔයා ඕන දෙයක් කරගන්න" යයි ඇ කීවේ විඩාවට පත්වූ. මීනා දෙස බලාගෙනය ." මොකක්? ... ලීසාට 20 යි කියන්නේ, ම... මටත් 20 යි. ඒ වුනාට මට අවුරුදු 13 යි නේ. මට පිස්සු හැදිල ද?" කියමින් ඇ ලඟම තියෙන කණ්නාඩියෙන් මුහුණ බැලුවාය.

“අනේ..... මම....වෙනස්, එහෙනම් ඒ හිනදා වෙන්නැති ලීසත් ගොඩක් වෙනස් වෙලා පෙනුනේ, ඒත් ඇයි...? කොහොම වුනත් මම හිටියට වඩා නම් ලස්සනයි වගේ. ටිකක් ඉන්න මගේ ambition එක වුණෙත් astronaut කෙනෙක් වෙන්න මට දැන් අවුරුදු 20 යි, ඉතින් තව මොනවද? මම... Time travel කරල ද? මොනා වුනත් කමක් නෑ එක්කො මගේ ලොකු ම හීනේ සබෑ කරගෙන යනුවෙන් ඈ සිතත්දිම ,Attention crew! We have 12 more minutes until landing on Mars’” මිහිරි හඬකින් එසේ කීවාය. “විනාඩි 12 ක්... කොහෙ ද ලීසා? යයි මීනා කියද්දිම “ඉක්මනට එන්න ලීසා“ කෑ ගැසුවාය මීනා ද ඉක්මනින්ම එතනට ගියා ය. සියලු දෙනාම නිශ්ශබ්දය. සියලු දෙනාම අවධානයෙන්, මීනා ද එසේමය.

“හරි එහෙනම් අපි Land කරන්න යන්නේ 5...4...3...2... එරර් එකක් පෙන්නනවා” යයි කණ්ඩායම් නායකයා කීවේය. සියල්ලෝම කලබලයට පත්විය. “ශ්ශ්.. නිශ්ශබ්ද වෙන්න ඉස්සෙල්ලා මැද තියෙන Red button එක ඔබන්න, ඊට පස්සේ ඊට යටින් තියෙන ස්විච් එක ඕන් කරන්න” ඒකෙන් Spacecraft එකට Emergency message එකක් යනවා Space craft කිසිම හානියක් වෙන්නේ නෑ. Land කරන Surface එකේ ගැටළුවක් පේනවා, Space craft එක ඊට එරෙහිව වැඩ කරනවා” ලීසා ද ඇතුළුව සියලු දෙනා මීනා දෙස පුදුමයෙන් බලා සිටියෝය. ඉක්මන් කරන්න “ මීනා කෑ ගැසුවාය. පයිලට් මීනාගේ අණ පිළිපැද්දේය. The space craft safely landed! සියලු දෙනාම සතුටට පත්විය. එමෙන්ම සියලු

දෙනාම මීනාට බෙහෙවින් ස්තූති කළහ. “පිස්සුව හොඳ වෙලා වගේ නේ” එසේ කීවේ ලීසාය. මීනා නිශ්ශබ්දව සිටියාය. නමුත් ඇයට ද ඇය එවැන්නක් කළ බව ද පුදුමයකි.

“ දැන් තමයි ඉතින් අමාරු ම Part එක Now, we have to work on the surface and collect some evidences too, any volunteers to go first? එසේ කීවේ කර්මාන්ඩය. කිසිවෙකුත් කැමැත්ත පල කොකළහ. “හරි අපි ඉස්සෙල්ලාම ගිහින් assume කරපු විදිහටම මේක safe ද කියල බලන්නම්” කියමින් ඔහු ඉදිරියට ගියේය. ඔහු සෙමින් සෙමින් ඉදිරියට ගියේය. “No problem at all” කියමින් ඔහු කෑ ගැසුවේය. එකිනෙකා පසුපස එකිනෙකා කෙමෙන් ඉදිරියට පැමිණියෝය. ලීසාට ද මීනාට ද ඉතාම සතුටුය. Oxygen tanks තියනකම් ඉතින් Safe මීනා කීවේ සිනාසෙමිනි. ලීසා ද සිනා සුනාය. “ඇයි මේ Space suit එක නැත්නම් මේ සීතලට අපි මැරිලා” ලීසා ද එසේ කීවා ය. “crew, පුළුවන් තරම් evidences එකතු කරන්න rocks, ice samples, red soil ඕන ම දෙයක්, ඔයාගේ specialized gloves  දාගෙන” යැයි නායකයා කීවේ ය.

ටික වෙලාවක් යද්දිම අමුතු දෙයක් වෙන්න පටන් ගත්තා. එක පාරටම පොලොව සෙලවුනා. ”මොකක් හරි වෙනසක් වෙනවා වගේ දැනෙනවා. කිසිම පාරිසරික බලපෑමක්  නැතිව ඇයි මේ හැමදේම සෙලවෙන්නේ”  මීනා ඇසුවාය. ඔව් මොකක් ද මේ වෙන්න යන්නේ?” ලීසා බියට පත් වුනාය.... එසැනින්ම එය නැවතුනාය. නැවතත් සුපුරුදු

පරිදිම සියලු දෙනාම නැවත ගවේෂණයේ යෙදුනාහ." " අර අතන තියෙන්නේ මොකක් ද?" මීනා යම්කිසි දෙයක් ලීසාට පෙන්නුවාය. Mars rock එකක් වෙන්නැති, "ඒකත් ගන්න" යැයි කියමින් ලීසා ඉදිරියට ගියාය. මීනා එයට ලං වනවාත් සමග අමුතු ශබ්දයක් ඇසුණාය. ඇයට සෙවනැල්ලක් මෙන් යම්කිසි දෙයක් පෙනුණි. ඇය එදෙසට අවධානය යොමු කළත් කිසිවක් පෙනෙන්නට තිබුණේ නැත. ඇය නැවතත් අර කුඩා ගල දෙස බැලුවත් එය පෙනෙන්නට නැත. ඇය පුදුමයට පත් වුණා ය. ඇය නැවතත් ඇවිදගෙන ඉදිරියට ගියා ය. ඉදිරියේ ඇය නැවතත් එය දැක්කා ය. එය ගලක් නොව ඊයේ මීනා විසින් පැළ කරන ලද බීජයයි. මීනා පුදුමයට පත් වුණාය. ඇය "ලීසා..." යනුවෙන් කෑ ගැසුවේ ලීසාට මේ පිළිබඳව දැනුවත් කිරීමටය. නමුත් ලීසා පමණක් නොව කිසිවෙකුත් පෙනේනනට නොමැත. ඇය නැවතත් කෑ ගැසුවාය. සියල්ල නොසොල්මන්ය. "කෝ මෙතන තිබුණ space craft එක?" ඒකත් නෑ, කිසිම කෙනෙක් නෑ මම විතරයි" යයි කියමින් මීනා කැගැසීය. එසැනින්ම නැවතත් සියලු දේ සෙලවෙන්නට පටන් ගත්තේය. පොලොවේ තිබුණු පස් පා වෙන්නට පටන් ගත්තේය. මීනා බියට පත් වුණාය. අර සෙවනැල්ල නැවතත් එහා මෙහා යයි. එම සෙවනැල්ල මීනා දෙසට එයි. "ඔව්...ඕව්..."කිසිවෙක් මුමුණයි." මී...නා...ඔව්" සෙවනැල්ල මීනා ලඟමය. සෙවනැල්ල තවත් ඉදිරියට එයි. ඔව් තවත් තව තවත් ආහ්...ආහ්.." මීනා කෑ ගැසුවාය.

පුදුමයකි. මීනා ඇගේ ඇඳේය."මොකද ළමයෝ කෑ ගහන්නේ? දැන් ඇති ඔය නිදාගත්තා නැගිටින්න නැගිටින්න" ඒ මීනාගේ අම්මාය."මොකක් ද? මම ඇඳේ ? එත...කො..ට ඒක හී... හීනයක් ද? ඇයි මට ඇත්තට ම දැනුනේ? මීනාට කියවුණි. "මීනා, මේ තේ එක බොන්න ඇවිල්ලා" මීනාගේ මව කච්චාය. මීනා කුස්සියට යන අතර තුර තාත්තා රූපවාහිනියේ ප්‍රවෘත්ති නරඹමින් සිටිනවා දැක්ක මීනා ඒ දෙස මා මදක් නැවතී බලා සිටියාය. එම ප්‍රවෘත්තියේ මෙසේ සඳහන් වීය. "මේ දැන් ලැබුණ විශේෂ පුවතක්. අන්තර්ජාතික අවකාශ ඒජන්සිය (ISA) එක්ලිප්ස් රන්ර් 12 අඟහරු ග්‍රහයා වෙත යාමට සැලසුම් කර ඇති බව දැනුම් දුනි. නමුත් මෙය සැලසුම් කර ඇත්තේ තවත් වසර 7 කින් පසුව පිටත්ව යාමටය. එනම් 2032 වර්ෂයේ ය. විද්‍යාඥයෝ මෙම කාලය තෝරාගෙන ඇත්තේ පෘථිවිය සහ අගහරු ග්‍රහයා එකිනෙකට අඩු දුරින් පිහිටා ඇති බැවිණි. එමඟින් ගමන වේගවත් සහ ආරක්ෂිත වන නිසාය.. එමෙන්ම යානයේ විශේෂ උපකරණ රැගෙන යනු ඇති අතර, එයින් එකක් ISA තවම පැහැදිළි කර නොමැති රහිසි ගත පර්යේෂණ කන්ටේනරයක් වේ. තව ද ISA 2032 වසර වන විට තව අභ්‍යාවකාශයාත්‍රින් එකතු කර ගනියි.

“අපි සියලු දෙනාම මෙම නව අභ්‍යාවකාශ ගමනට හදවතින්ම සුබ පැතුම් එක් කරමු.”

-නිමි-



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දයාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරි වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද , දියවඩන නිළමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)